ජනාවාස පිළිබඳ පුහුණු වැඩහල

# 1976 මාර්තු මස 10 වන දින ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ පැවති ජනාවාස පිළිබඳ පුහුණු වැඩහලෙහි වැඩ කටයුතු පිළිබඳ කෙටි සටහනකි

ප්‍රකාශන මාලා අංක 19                1976 මාර්තු

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය,
තැ.පෙ. 1522,
කොළඹ.

# පෙරවදන

ගොවිකටයුතු අංශයේ මෑතදී ඇති වූ වේගවත් වෙනස්වීම් හේතුකොටගෙන, ඇති වූ නව ආයතන අතර ජනාවාසවලට ප්‍රමුඛස්ථානයක් හිමි වේ. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම යටතේ ඇති ජනාවාස 170 ක පමණ තරුණ තරුණියන් 20,000 කට ආසන්න පිරිසක් සේවය කරන අතර ජනාවාස තුළින් බලාපොරොත්තු වන මූලික අරමුණු සපුරා ගැනීම සඳහා ඔවුනට නිවැරදි පුහුණුවක් දීම අත්‍යවශ්‍ය කාර්යයක් වන්නේය.

ගත වූ අවුරුදු තුන ඇතුළත ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් ජනාවාසිකයින් උදෙසාත් ඒවා මෙහෙයවන්නන් උදෙසාත් ක්‍රියාත්මක කළ පුහුණු වැඩපිළිවෙළ සමාලෝචනය කර අනාගතයේදී අර්ථාන්විත පුහුණු පාඨමාලා සකස් කර ගැනීම සඳහා ක්‍රියා මාර්ගයක් පිළිබඳව සොයා බැලීම ජනාවාස පුහුණුව පිළිබඳව වූ වැඩහලෙහි පරමාර්ථය වීය.

විවිධ **දෙපාර්තමේන්තුවල** නිලධාරීන්, ජනාවාස කටයුතු මෙහෙයවන්නන්, ජනාවාසවල කණ්ඩායම් නායකයින් හා ජනාවාසිකයින් අතර සුහද අදහස් හුවමාරුවකදී ඉස්මතු වූ වැදගත් කරුණු පිළිබඳ සම්පිණ්ඩනයක් මෙම ප්‍රකාශනයෙහි ඇතුළත් වේ.

සී. නාරායනසාමි
අධ්‍යක්ෂ

## 1976 මාර්තු මස 10 වන දින ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේදී පැවැති ජනාවාස පුහුණුව පිළිබඳ වැඩහල

### ආරම්භක දේශනය

කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් මහින්ද සිල්වා විසිනි

ජනාවාස ක්‍රමය දිවයිනෙහි ආරම්භ කර දැනට අවුරුදු තුනක් පමණ ඇත. දිවයින පුරා ජනාවාස 170 ක් පමණ ඇති අතර ඒවායේ තරුණ තරුණියන් විසි දෙදාහක් පමණ සේවයේ නියැලී සිටිති. එම ජනාවාසවලට අක්කර 48,000 ක් පමණ භූමි ප්‍රමාණයක් අයත් වන්නේය. අවුරුදු තුනක ලද අත්දැකීම් අනුසාරයෙන් මෙම ජනාවාසවලට නීතිමය පදනමක් දීම සඳහා නව නීති රීති මාලාවක් කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය විසින් සකස් කර ඇත. මෙම නීති රීති මාලාව එම ජනාවාස නව ආයතනයක් වශයෙන් ගොඩ නැංවීමට උපකාර වනු ඇත.

මෙම නීති රීති 1935 දී සම්මත කරන ලද ඉඩම් සංවර්ධන ආඥා පනතින් පසුව මෙරටෙහි ඇති වූ ඉතා වැදගත් නීති රීති මාලාවක් ලෙස සැළකිය හැක. 1935 ඉඩම් සංවර්ධන පනතින් එවකට පැවති තත්වයට ගැලපෙන අයුරින් ඉඩම් බෙදීම, ඒවා ජනාවාස කිරීම, ඉඩම් ඒකාබද්ධ කිරීම හා සංවර්ධනය කිරීම ආදිය සඳහා විධිවිධාන සළසන ලදී. දශක තුනක පමණ කාලයක් තුළ ඉඩම් බෙදීම හා ජනාවාස කිරීම ආදී කටයුතු කරන ලද්දේ මේ පනතේ විධිවිධාන යටතේය.

මෑතදී ලංකාවේ ඇති වූ වෙනස්කම් අනුව 1935 ඉඩම් සංවර්ධන ආඥා පනත යල් පැන ගිය එකක් ලෙස සැළකීමට සිදු වේ. මෙම පනතින් ඉටු කළයුතුව තිබූ සේවාවන් හා අදාළ වුනු කාලපරිච්ඡේදය අවසාන වී ඇති අතර ජනාවාස පනත ඉදිරිපත් කර ඇත්තේ ඉදිරි යුගය සඳහාය. ඕනෑම ගොවි කණ්ඩායමකට; යායක එකමුතුව හෝ එසේ නැතහොත් ඉඩම් කට්ටි ඒකාබද්ධ කර හෝ ගොවිතැන් කිරීම සඳහා අවශ්‍ය බලතල සැලසීමට අවශ්‍ය ජනාවාස පනතින් පිළිවන් වන්නේය. මෙම ජනාවාස පනත නිසියාකාරව ක්‍රියාත්මක වුවහොත් ඉහත සඳහන් කළ අක්කර 48,000 ට සීමා නොවී ඊට වඩා විශාල භූමි ප්‍රමාණයකට අදාළ වන පනතක් බවට පත් වන්නට ඉඩ තිබේ.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමේ සහභාගිත්වය ඇතිව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් ආරම්භ කරන මෙම වැඩහලේ පරමාර්ථය වනුයේ ජනාවාස සඳහා කවර ආකාරයක පුහුණුවක් යොදා ගත යුතුද, මෙතෙක් ලබා දී ඇති පුහුණුව ප්‍රමාණවත් වූයේද, ඒවායේ ඇති අඩුපාඩු කවරේද, එම අඩුපාඩු සඳහා යොදා ගත යුතු ප්‍රතිකර්මයන් මොනවාද යනාදී කරුණු ඉස්මතු කර ගැනීමයි. මෙහිදී කරනු ලබන නිගමනයන්ට අනුව, අදාළ ආයතන හා සම්බන්ධව ක්‍රියාත්මක වැඩසටහනක් දියත් කිරීමද එක් අරමුණකි.

පුස්...

## වැඩහලේ පරමාර්ථ — ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති ජේ.එච්.ජේ.විජේදාස විසිනි

ඉඩම් ප්‍රතිසංස්කරණයෙන් රජය අදහස් කළේ හුදෙක් ඉඩම් අයිතිය අක්කර 50 කට සීමා කිරීම හෝ රජයට පැවරුනු ඉඩම්, කැබලි කර ගොවි ජනතාව අතර බෙදා දීම හෝ පමණක් නොවේ. මෙම කාර්යයන් නීතිමය හා පාලනමය ක්‍රියා මාර්ගයක් මගින් පහසුවෙන්ම කළහැකි වන්නේය. ඉඩම් ප්‍රතිසංස්කරණයෙන් රජය අදහස් කළේ ප්‍රධානතම සම්පතක් වන භූමිය උපයෝගී කරගෙන කෘෂිකාර්මික නිෂ්පාදනයේ උපරිම මට්ටමක් ළඟා කර ගැනීම හා රටෙහි සීමිත ඉඩම් ප්‍රමාණය තුළ රැකියා අවස්ථාවන් වැඩි කිරීමත්ය. ජනාවාස වැඩපිළිවෙල ආරම්භ කරන ලද්දේ පසුව කී පරමාර්ථ දෙක සපුරා ගැනීම සඳහාය.

ජනාවාස ක්‍රමය නව සංකල්පයක් ලෙස සළකනු ලැබුවත් සමහර සාමූහික නිෂ්පාදන ක්‍රමයන් මෙරටෙහි ගම්බදව තිබූ බව අපගේ ඉතිහාසය ඇසුරින් ඔප්පු වේ. දැනුදු ගම්බදව දක්නට ලැබෙන ගොයම් කයිය, අත්තම් ක්‍රමය ආදිය මෙම පැරණි ගොවිතැන් ක්‍රමවල නෂ්ඨාවශේෂ වන්නේය. ජනාවාස ක්‍රමය, එවැනි සාමූහික ක්‍රමවල යහපත් අංගෝපාංග නැවත නගා සිටුවීමට දරණ ප්‍රයත්නයක් ලෙස සැළකිය හැක.

ලාභ බෙදා දීම ජනාවාස ක්‍රමයෙහි තවත් වැදගත් අංගයකි. ජනාවාසවල සාමාජිකයින් හට දෛනික දීමනාවක් විනා වැටුපක් නොලැබේ. ජනාවාසයෙන් ලාභ ලැබෙන විට ඉන් කොටසක් සාමාජිකයින් අතර බෙදේ. ජනාවාසයක කණ්ඩායම් ක්‍රමයද සැළකිල්ලට ගත යුතු කාරණයකි. කණ්ඩායම් ක්‍රමය හේතුකොටගෙන එක් එක් පුද්ගලයින්ගේ නිපුනතාවයන් හා දක්ෂතාවයන් යෝග්‍ය පරිදි උපයෝගී කර ගැනීමට හැකි වන්නේය. ජනාවාස ක්‍රමයක ඉතාමත් වැදගත් වනුයේ ස්වයං පාලනයයි. ඉදිරි අනාගතයේදී සම්පූර්ණයෙන්ම ගිණුම් කටයුතුද ඇතුළුව සියළුම වැඩ කටයුතු ජනාවාසයේ සාමාජික සාමාජිකාවන් විසින්ම ඉටු කළයුතු අවස්ථාවක් එළඹෙනු ඇත.

මෙවැනි යෝජනා ක්‍රමයක නිරතව සිටින සාමාජික සාමාජිකාවන් හට අදාළ වන පුහුණු අවශ්‍යතාවයන් කවරේද යන්න නිගමනය කළයුතු වේ. ගොවිතැන් ක්‍රම පිළිබඳ ශිල්පීය දැනුම, ක්‍රමවත් ගිණුම් පාලනය, කෘෂිකර්ම ව්‍යාපෘති කටයුතු ආදිය පිළිබඳ පුහුණුව ජනාවාස සාමාජික සාමාජිකාවන් හට වැදගත් වේ.

ජනාවාසයක ගිණුම් කටයුතු පිළිබඳ පුහුණුව ඉතාමත් ඉක්මණින් සපුරාලිය යුතු කාර්යයකි. ස්වයං පාලනය යටතේ සිය ගිණුම් කටයුතු තමන් විසින්ම පවත්වාගෙන යාම, අයවැය ලේඛනය සකස් කිරීම, ලාභ අලාභ ගිණුම් සකස් කිරීම හා සමූපකාර විගණක කටයුතුවලට මුහුණ දීමට හැකි වන පරිදි පොත් පත් තබා ගැනීම ආදිය ගැන පුහුණුවක්

ජනාවාසිකයින්ට දීම අත්‍යවශ්‍යය. මෙම පුහුණුව තෝරා ගත් ඉලක්ක කණ්ඩායම්වලට පළමුවෙන් ලබා දිය යුතුය.

ජනාවාසයක වතු අධිකාරී-කම්කරු සම්බන්ධතාවය නොපවතී. එහි සේවය කරනුයේ එකම මට්ටමක පුද්ගලයින් පිරිසකි. සාමාජිකයින් විසින්ම නායකත්වයක් දී තිල නම් කරන ලද තිහිප දෙනෙක් පමණක් ඔවුන් අතර සිටිත්. ජනාවාසයක සාමාජිකයින්ට හෝ එහි කණ්ඩායම් නායකයින්ට හෝ අදාළ සමිතියේ සභාපති වරුනට හෝ දිය යුතු කළමනාකරණය පිළිබඳව පුහුණුව මෙහිදී නව මුහුණුවරක් ගනී.

පුහුණු කරවන්නන්ගේ ඉලක්ක කණ්ඩායම් තෝරාගෙන ඒ අයට පුහුණුවක් දීම ගැන වැඩි සැළකිල්ලක් දැක්විය යුතුය. සමහර අංශ ගැන පුහුණුවක් ලබා දීම, කෙලින්ම කරනවා වෙනුවට, වක්‍ර ක්‍රමයකින් සාමාජිකයින්ට හඳුන්වා දිය හැක. උදාහරණයක් ලෙස කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරී ව්‍යාප්ති කටයුතු කරන අතර, අනිකුත් විෂයයන් ගැන සාමාජිකයින්ට කරුණු පැහැදිලි කර දීම.

## වැඩහලේ පරමාර්ථ

## ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ සී. නාරායනසාමි විසිනි

ජනාවාසවලට අවශ්‍ය නොයෙකුත් අංශවල පුහුණුකිරීම් පවත්වන ලදී. කෙසේ වෙතත් පුහුණුව ලබා දීමේදී ඇතැම් දුෂ්කරතාවයනට මුහුණ දීමට සිදු විය.

මුලින් 40 ක් පමණ තිබූ ජනාවාස දැන් 175 ක් පමණ දක්වා වැඩි වී ඇත. මෙම ව්‍යාප්තියට අවශ්‍ය පරිදි පුහුණුවීමේ කටයුතු කරගෙන යාම සඳහා ප්‍රමාණවත් තරම් නිලධාරීන් සංඛ්‍යාවක් නොසිටීම මෙහිදී සැළකිල්ලට ගත යුතුය. ජනාවාස සාමාජික සාමාජිකා වන්ට, ඒවායේ නායකත්වයට සහ ඒවා භාරව කටයුතු කරන නිලධාරීන්ටද අදාළ නොයෙකුත් අංශ සම්බන්ධයෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් සෑහෙන පුහුණුවක් ලබා දී ඇති බව පැහැදිලිය. මෙම වැඩහලෙහි එක් පරමාර්ථයක් නම් ජනාවාස සඳහා දී ඇති පුහුණුව සෑහේද, ඒවායේ අඩුපාඩු මොනවාද යනාදිය ගැන සමාලෝචනයක් කිරීමයි. වැඩහලේ අතිශයින් වැදගත් අරමුණ වනුයේ එට සහභාගී වන සාමාජික සාමාජිකාවන්, නායකයින්, නිලධාරීන් ආදීන් අතර මෙතෙක් කෙරී ඇති ජනාවාස පුහුණුව පිළිබඳ අදහස් හුවමාරු කර ගැනීමත් ඉදිරියට සුදුසු පුහුණුවීමේ වැඩසටහන් මාලාවක් සකස් කර ගැනීමත්ය.

ඉදිරි කාර්යය සඳහා පුහුණුව ලබන්නන්ගේ අවශ්‍යතා වයන් හඳුනා ගැනීම වැදගත්ය. ජනාවාස සංකල්පයෙහි ඔලික පරමාර්ථයක් නම් උපරිම කෘෂිකාර්මික සංවර්ධන මට්ටමක් ඇති කිරීමයි. ඒ සඳහා යහපත් කළමනාකාරිත්වයක් ජනාවාස තුළ තිබීම අත්‍යවශ්‍යය. එමෙන්ම

මුදල් පාලනය පිළිබඳවද සාමාජික සාමාජිකාවෝ දැනගෙන සිටිය යුතුය. දේශපාලනික වශයෙන් ජනාවාස සංකල්පයෙහි අරමුණ කෙරෙහිද අවබෝධයක් ඔවුනට තිබිය යුතුය. නොයෙකුත් පුහුණුකිරීමේ ක්‍රම හා මාර්ග ඇතුළත් ජනාවාස සඳහා ගැලපෙන පුහුණුවක් පිළිබඳව දැන ගත යුත්තේ මෙවැනි වැඩහලක කෙරෙන අදහස් හුවමාරුවක් මගිනි. යොදා ගත යුතු නොයෙකුත් පුහුණු පාඨමාලා, පුහුණුකිරීමේ ක්‍රම, පුහුණු කරවන්නන් යනාදිය සම්බන්ධයෙන් අද දින එළඹෙන තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේත්, මෙම ආයතනයේත් අදාළ අනිකුත් ආයතනවලත් සහයෝගය ඇතිව මුදුරු අනාගතයේදී ක්‍රියාත්මක වැඩපිළිවෙලක් දියත් කිරීමට බලාපොරොත්තු වෙමු.

## ජනාවාසවල පුහුණු කටයුතු – සමාලෝචනයක්

**ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ අධ්‍යක්ෂ (පුහුණු) කරුණාසේන ජයලත් විසිනි**

ජනාවාසවල පුහුණු වැඩ කටයුතු දැනට වඩා ක්‍රමානුකූලවත් සාර්ථකවත් කරගෙන යාම සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීම මෙම සම්මන්ත්‍රණයේ මූලික අරමුණ වන්නේය. මෙතෙක් කරගෙන ගිය පුහුණු වැඩ කටයුතු සම්බන්ධ සමාලෝචනයක් කිරීම ඉදිරි වැඩසටහන් පිළියෙල කර ගැනීමට ආධාරක විය හැක.

මුලීම ජනාවාසය 1973 ජනවාරි මාසයේදී දම්මුලහේනෙහිදී ආරම්භ කරන ලදී. එවකට පුහුණු කිරීම සඳහා වෙනම අංශයක් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමෙහි නොතිබුනත් ජනාවාස සංඛ්‍යාව සුළු වීම නිසා පුහුණු වැඩ කටයුතු සම්බන්ධයෙන් වැඩි කාලයක් මිඩංගු කිරීමට පිළිවන් විනි. ජනාවාසයක් මුලින්ම ආරම්භ කිරීමේදී ඒ සඳහා බඳවා ගනු ලැබූ සාමාජිකයින් පමණක්නොව එම ප්‍රදේශයේ ග්‍රාමීය ආයතන වන ගම් සභා, පලදා වර්ධන කමිටු, සමූපකාර සමිති වැනි ආයතනවල නායකයින් හා නියෝජිතයින් කැඳවා ඔවුන් සමඟ ග්‍රාමීය මට්ටමේ සාකච්ඡාවක් පවත්වා සාමාජික සාමාජිකාවන්ට ජනාවාස ක්‍රමය ගැන සෑහෙන අවබෝධයක් ලබා දෙන ලදී. මෙසේ කරන ලද්දේ පරමාර්ථ දෙකක් සපුරාලීම සඳහාය. පළමුව ජනාවාස ක්‍රමය අළුත් දෙයක් නොවුවත් දැනට නව සංකල්පයක් හෙයින් දේශපාලනික හා සාමාජික වශයෙන් එතරම් විශ්වාසයක් නොතිබී මෙම සංකල්පය ගැන අවබෝධයක් සාමාජික සාමාජිකාවන්ට පමණක්නොව අවට ගම්වාසීන්ටද ලබා දීමට අවශ්‍ය වීම නිසාය. දෙවනුව ජනාවාසයට බඳවා ගත් අළුත් සාමාජිකයින් මෙන්ම කම්කරුවන් ලෙස වැඩ කළ පැරණි සාමාජිකයින් හටද පහත සඳහන් කරුණු පිළිබඳව හැඳින්වීමක් ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය විනි.

1. ජනාවාස සංකල්පය;
2. වර්තමාන ආර්ථික තත්වයට තුඩු දුන් ඓතිහාසික පසුබිම පිළිබඳ අදහසක්;
3. ලංකාවේ පැරණි ඉඩම් පරිහරණ ක්‍රමය සහ එය පදනම් කොට ගත් ආර්ථික, දේශපාලනික, සාමාජික හා සංස්කෘතික ජීවන රටාව;

4. ජාතික අවශ්‍යතාවයන් සපුරාලීමෙහි ලා ජනාවාසවල ඇති වැදගත්කම;
5. ආවේණික ඉඩම් පරිහරණය හා ජනාවාස අතර ඇති සම්බන්ධය;
6. නව ගොවිජන ප්‍රතිපත්තිවල අවශ්‍යතාවය හා ජනාවාස තුළින් ඒවා සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව;
7. ජනාවාස තුළින් ගොඩ නැංවෙන නව සංස්කෘතිය;
8. ජනාවාස හා අවට ගම් අතර සම්බන්ධතාවය;
9. පොදු ජාතික කටයුතුවලදී ග්‍රාමීය මට්ටමේ නායකත්වයක් දීම අතින් ජනාවාස සතු වගකීම.

මුලින්ම මෙම කරුණු සම්බන්ධ සවිස්තර අවබෝධයක් ලබා දීමට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමට පුළුවන්කම ලැබුනි. ඒ ඒ ජනාවාසයට ගැලපෙන සංවර්ධන සැළැස්මක් සකස් කිරීමෙන් පසු එම සංවර්ධන සැළැස්ම මාසික වැඩසටහන තුළින් ක්‍රියාත්මක කරන අතරවාරයේදී ජනාවාසයට ගොස් සාමාජිකයින් සහභාගී කරවාගෙන සාමූහිකත්වය හා හවුල් ගොවිතැන පදනම් කරගෙන ස්වයං පාලන ක්‍රමයක් ඉලක්ක කර තනිවීන් කෘෂිකාර්මික වැඩපිළිවෙල ක්‍රියාත්මක කළහැකි අන්දම පිළිබඳව, මහා සභාව, කාරක සභාව, වැඩ කණ්ඩායම්, අතුරු කමිටු වැනි ආයතනික රාමුව තුළින් සම්පූර්ණ සහයෝගය ලබා ගැනීමට හැකි වූවේය. මෙය කරගෙන යන ලද්දේ ඉඩම් අක්කර පන් ලක්ෂ හැටදාහක පමණ ප්‍රමාණයක පුද්ගලික අයිතිය මාරු කිරීමත් සමඟය. එහෙයින් ජනාවාස ක්‍රමය විශාල පරිමාණයක පරිවර්තනයක් තුළ හදිසියෙන් කළයුතු වූ නව පරිවර්තනයක් විය. 1973 අවසානය වනවිට ජනාවාස 19 ක් පිහිටුවා තිබුනි. එහෙයින් ඉහත සඳහන් පරිදි සාමාජිකයින් හට පුළුල් වශයෙන් පුහුණුවක් දීමට එම අවදියේ අපට පිළිවන් විනි.

පුහුණුවීමේ අංශයක් පිහිටුවීමේ වැඩ කටයුතු මුලින්ම ආරම්භ කරන ලද්දේ 1974 දීය. මෙම වර්ෂයේදී දුෂ්කරතාවයන් මධ්‍යයේ වුවද, මේතෙක් කරගෙන ගිය ජනාවාස කටයුතුවල සාර්ථකත්වය නිසා දේශපාලනික මට්ටමින්, ජාතික මට්ටමින්, ප්‍රාදේශීය මට්ටමින් හා සාමාජික මට්ටමින් ඒවා කෙරෙහි වැඩි අවධානයක් යොමු වන්නට විය. මේ අනුව බිහි වූ උද්යෝගය නිසා 1974 වර්ෂයේ මාස තුනක් ඇතුළත ජනාවාස සඳහා අක්කර 50,000 ක් ඉලක්ක කර ගන්නා ලදී. මේ අවස්ථාවේදී පුහුණු කරවන්නන් හා මෙහෙය වන්නන් සංඛ්‍යාව වැඩි නොවුවත් මෙම ඉලක්කය සපුරාලීම සඳහා කටයුතු කළයුතු වීය. මේ අනුව 1974 අවසාන-භාගය වනවිට පිහිටුවන ලද ජනාවාස සංඛ්‍යාව එකසිය තිස් ගණනක් විය. මින් පසුව කලින් මෙන් සාමාජික සාමාජිකාවන්ගේ මහා සභාව රැස් කර ඔවුන් සමඟ සහභාගිත්වයෙන් කටයුතු කර ඔවුනට අවශ්‍ය වන්නාවූ ශිල්පීය, කළමනාකරණ හා සමාජීය කරුණු පිළිබඳ පුහුණුවක් පෞද්ගලික වශයෙන් එක් එක් ජනාවාසයක් සඳහා ලබා දීමට හැකි නොවූයේ වැඩි වූ ජනාවාස සංඛ්‍යාව සමඟ ඒවා මෙහෙයවන නිලධාරී සංඛ්‍යාව වැඩි නොවූ හෙයිනි. කෙසේ වෙතත් මෙම තත්වයට මුහුණ දී, ජනාවාස තුනක් හෝ හතරක් ඒකාබද්ධ කර ජනාවාස කණ්ඩායම්වලට පුහුණුවක් දීමට විධිවිධාන සළස්වන ලදී. මේ අනුව පළාත්බද පුහුණු මධ්‍යස්ථාන පිහිටුවන ලදී. ජනාවාසවල වැඩ කණ්ඩායම්වල නායකයින්ට, සභාපති හා

ලේකම් එසේ නැතහොත් අතුරු කමිටුවල නායකයින් වැනි ප්‍රමුඛස්ථානයක් ගත් සාමාජික සාමාජිකාවන්ට පුහුණුවක් ලබා දුනි. නායකත්වයක් දැරීමට කුශලතාවයක් පෙන්වූවන් හට දින දෙකක හෝ තුනක අභ්‍යාසයක් ලබා දීම අපේ අරමුණ විය. තවද මෙම අවධිය වනවිට සාමාජික සාමාජිකාවන්ගෙන් අනිකුත් සාමාජිකයින්ටත්, නිලධාරීන්ගෙන් අනිකුත් ක්ෂේත්‍ර නිලධාරීන්ටත්, ගුවන්විදුලිය, පුවත්පත වැනි ප්‍රචාරක මාධ්‍ය මගිනුත් ජනාවාස සංකල්පය ප්‍රචලිත වී තිබුණේය. මෙම අවස්ථාවේදී කලින් ලබා දෙන ලද පුහුණුවට වඩා දේශපාලනමය, සමාජමය, සංස්කෘතිමය වශයෙන් ඉහළ මට්ටමින් පුහුණුවක් අවශ්‍ය වන බව අපට ප්‍රත්‍යක්ෂ විණි. ලංකාව අධිරාජ්‍යවාදී ක්‍රමයට ගොදුරු වී ඇති ආකාරය, ලංකාවේ ඓතිහාසික, දේශපාලනික හා සමාජයීය පසුබිම, යටත් විජිතවාදී බලපෑම් තුළින් ලංකාවේ අද නිර්මානය වී ඇති දේශපාලන, සමාජයීය හා සංස්කෘතික මුහුණුවර, සමාජවාදී ගමන ඉදිරියට ගෙන යාමේදී සතුරන් හා මිතුරන් හඳුනා ගැනීම, ලංකාවේ සමාජ පංති විකාශනය, පංතිවල ක්‍රියාකාරිත්වය හා පංති ගැටළු අවබෝධය යන කරුණු ජන සමාජයට හා විශේෂයෙන් ජනාවාසවලට බලපාන ආකාරය ආදිය පිළිබඳව පුළුල් මට්ටමකින් සාමාජික සාමාජිකාවන්ට පුහුණුවක් දීමට ප්‍රයත්නයක් දරන ලදී. අනතුරුව මෙම ප්‍රශ්න සඳහා ඇති විසඳුම්, අළුත් ගොවිජන ප්‍රතිපත්තිය, සවයං පාලන ක්‍රමය, විවේචනය හා ස්වයං විවේචනය තුළින් පාලනය තහවුරු කිරීම, ස්වශක්තිය කෙරෙහි විශ්වාසය තැබීම, ජනාවාසවල ආර්ථික හා සාමාජික කාර්ය භාරය, රටට අවශ්‍ය වන කෘෂිකර්ම ප්‍රතිපත්තිය, ජනාවාස තුළින් ගොඩ නැන්වීමට අපේක්ෂා කරන සමාජයීය මුහුණුවර, විද්‍යාත්මක ඉඩම් පරිහරණය හා ජනාවාසවල සංවර්ධන සැළසුම්, ජනාවාස තුළ අනුගමනය කළයුතු ඉඩම් පරිහරණ ක්‍රමය, සංවර්ධන සැළැස්ම හඳුනා ගැනීම, ඉඩම් පරිහරණ රටාව, ජනාවාස තුළ ආයතනික සංවිධානය පිළිබඳ අවබෝධය, වැඩ කණ්ඩායම් තහවුරු කිරීම, සාමාජිකයින් සංවර්ධන සැළැස්මට සහභාගී වීමේ වැදගත්කම ආදී කරුණු කෙරෙහිද පුහුණු කටයුතුවලදී සැළකිල්ල යොමු කරන ලදී.

මේ කාලය වනවිට ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා වෙනම පුහුණු වැඩපිළිවෙලක් සකස් කිරීමට කටයුතු සළස්වන ලදී. සාමාජික සාමාජිකාවන් පුහුණු කිරීමට ප්‍රමාණවත් පිරිසක් නොසිටි හෙයින් ජනාවාසවල ප්‍රමුඛස්ථානයක් ගන්නා නායකයින් තෝරා අවට ජනාවාස එම නායකයින් යටතේ මෙහෙයවීමට වැඩ පිළිවෙලක් දියත් කරන ලදී. මෙම ක්‍රමය ඉතාමත් හොඳින් සාර්ථක වූ බව කිව හැකිය. තම ජනාවාසයෙහි ප්‍රශ්නවලට මුහුණ දීම තුළින් ලද අත්දැකීම් අනිකුත් ජනාවාස මෙහෙයවීමේදී ඔවුනට ඉමහත් රුකුලක් විය.

1975 වර්ෂයේ මැද භාගයේදී පුහුණු කටයුතු පිළිබඳව කෙරුණු විමර්ශනයකින් දේශපාලනමය හා සමාජමය වශයෙන් දෙනු ලැබෙන පුහුණුව අවශ්‍යද යන්න කෙරෙහි ඇති වූ අවිනිශ්චිත ස්වභාවය නිසා මේ පිළිබඳව දෙන පුහුණුව අත්හිටුවන ලදී. මින් පසුව කෘෂිකර්මය පිළිබඳව දෙනු ලැබෙන විද්‍යාත්මක දැනුම පිළිබඳ පුහුණුව වැඩි කරන ලදී. කෙසේ වෙතත් කෘෂිකාර්මික, සංවර්ධනය හා ශිල්පීය කරුණු පිළිබඳ දැනුම ලබා දෙන අතරම ඒ හා බැදුනු සමාජයීය හා දේශපාලනික අවබෝධයක් සාමාජික සාමාජිකාවන්ට දීම හොඳ යයි අත්දැකීමෙන් ඔප්පු වී ඇත. මෙම කාර්යයන් දෙකම එකට අත්වැල් බැඳගෙන

නොගියහොත් නොයෙකුත් දුෂ්කරතාවයන් මතු විය හැකි බව පෙනී ගියේය. එහෙයින් නැවත වරක් මුල් පරිදි මෙම පුහුණුවද ඉදිරිපත් කරන ලදී. මේ වනවිට ඇති වූ දේශපාලනික අවිනිශ්චිතතාවය නිසාත් ආර්ථිකමය දුෂ්කරතාවයන් නිසාත් ඇතැම් ජනාවාසවල පසුබෑමක් දක්නට ලැබුණ හෙයින් ඉක්මණින් දේශපාලනික අවබෝධය නැවත ලබා දීම වැදගත් බව පෙනී ගියේය. ඉඩම් අයිතිය ජනාවාසයට පැවරීමෙන් හෝ එසේ නැතහොත් ලාභ බෙදා දීම වැනි ක්‍රියා මාර්ගයක් මගින් සාමාජික මානසික තත්වය ජනාවාස සංකල්පය කෙරෙහි මනාව යොමු කිරීමෙන් පසුව මෙවැනි පුහුණුවක් ලබා දීම වැදගත් වන්නේ යයි තීරණය කරන ලදී.

ජනාවාසවල සාමාජික සාමාජිකාවන්ට පුහුණුව ලබා දීමේදී ඔවුන් දැන් සිටින ජීවන තත්වය, ආර්ථික තත්වය හා සමාජ තත්වය පිළිබඳව අවබෝධයක් තිබිය යුතුය. පුහුණු කරවන්නන් විසින් දෙනු ලැබෙන උපදෙස් මනාව අවබෝධ කරගෙන ඒවා පිළිපදින තත්වයකට මානසික මට්ටමින් මෙන්ම ආර්ථික මට්ටමින්ද සාමාජිකයින් ගොඩ නන්වාලිය යුතුය. කලට වේලාවට ඔවුනට අවශ්‍ය යෙදවුම් ලබා නොදී උපදෙස් දීමෙන් වැඩක් නැත. දෙනු ලැබෙන පුහුණුව ශිල්පීය හෝ වේවා කෘෂිකාර්මික හෝ වේවා දේශපාලනික හෝ වේවා සමාජමය හෝ වේවා එකිනෙකට සම්බන්ධතාවයක් තිබිය යුතු වන අතර එසේ නොවුවහොත් සම්පූර්ණ පුහුණුවම අසාර්ථක වන්නට ඉඩ තිබේ.

බොහෝ අවස්ථාවල ජනාවාස සඳහා ලැබී ඇත්තේ නොසළකා හරිනු ලැබූ ඉඩම්ය. මෙම ඉඩම් සංවර්ධනය කිරීමෙහි ලා මහත් වෙහෙසක් දැරීමට සිදු වන බවට සාමාජික සාමාජිකාවන් හොඳින්ම දනී. එහෙයින් එවැනි ඉඩම් සංවර්ධනය කිරීමෙහි ලා අත්‍යවශ්‍ය වන යෙදවුම් කලට වේලාවට ඔවුන් හට ලබා දීම ගැන පුහුණුවට පෙර සැළකිලිමත් විය යුතුය. නිදසුනක් වශයෙන් මුලින්ම ආරම්භ කළ ජනාවාසය වන දම්මුලහේන කාලයක් තිස්සේ නොසළකා හරිනු ලැබූ ඉඩමකි. මෙය සංවර්ධනය කිරීම අතිශයින් දුෂ්කර කාර්යයක් වූයේය. මේ අතරතුර ආර්ථික තත්වයේ ඇති වූ දුෂ්කරතාවයන් නිසා පාරිභෝගික භාණ්ඩ ගණනාවක මිළ ඉහළ ගියත් ජනාවාස සාමාජික සාමාජිකාවන් වැඩ කරගෙන ගියේ රු. 3/- ක හෝ රු. 4/- ක සුළු දෛනික දීමනාවක් ලබමිනි. එසේම ජනාවාසවල තරුණ පිරිසගෙන් වැඩි දෙනෙක් ගොවිතැන තම ජීවනය කර ගැනීමට අරමුණු කරගෙන සිටි අය නොවූහ. සෑහෙන අධ්‍යාපනය ලත් ඔවුන් හැම කෙනෙකුගේම වාගේ පරමාර්ථය වූයේ රජයේ සේවයේ හෝ සංස්ථාවක තනතුරක් ලබා ගැනීමයි. ජනාවාසය ආර්ථික වශයෙන් ලාභ දෙන ව්‍යාපාරයක් බව ඔවුන් තුළ ඒත්තු නොගන්වා, පුහුණු කිරීමේ පංති පැවැත්වීමෙන් එතරම් ප්‍රයෝජනයක් නැත.

ජනාවාස සංකල්පය පිළිබඳව කිසිම සැකයක් හෝ අවිශ්වාසයක් සාමාජික සාමාජිකාවන් තුළ හෝ සමාජය තුළ හෝ නොමැත. ගත වූ අවුරුදු තුන තුළ මෙම සංකල්පය තහවුරුව ඇති බව පෙනේ. එතකුදු වුවත් ආර්ථික දුෂ්කරතාවයක් මධ්‍යයේ ඉතාමත් සුළු වේතනයක් ලබමින් මෙම කාර්යය ගෙන යන තරුණ තරුණියන් හට පුහුණුවක් ලබා දීමේදී පළමුවෙන්ම

ගණන් ගත යුත්තේ ආර්ථික වශයෙන්, භෞතිකමය වශයෙන් ඔවුන් ලැබිය යුතු දියුණුව පිළිබඳවයි. ආර්ථිකමය වශයෙන් තමන් හට කවර හෝ ලාභයක් ලැබෙන්නේය යන විශ්වාසය සාමාජික සාමාජිකාවන් තුළ තහවුරු කරන හා ක් කල් පුහුණුවීමේ කටයුතු ආරම්භ කිරීමට සුදුසු වාතාවරණයක් නොඑළඹෙන බව කිව යුතුය. ජනාවාස සාමාජික සාමාජිකාවන් සඳහා දෙනු ලැබෙන පුහුණුවකදී ඔවුන්ගේ පෞද්ගලිකත්වය පිළිබඳ කරුණු අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය වේ. මෙම ජනාවාසවලට පැමිණ ඇත්තේ කිසිවක් කර ගත නොහැකි අසරණ තත්වයකට පත් තරුණ තරුණියන් පිරිසකි. පෞද්ගලික වශයෙන් ඔවුනට සමාජයේ මුහුණ දීමට ඇති ප්‍රශ්න ගැන විශේෂ සැළකිල්ලක් නොගෙන ඔවුන් සඳහා පුහුණු කටයුතු යෙදිය හැකි නොවේ.

තවත් වැදගත් කරුණක් වනුයේ ජනාවාස සාමාජික සාමාජිකාවන්ගේ දැනුම පිළිබඳ මට්ටමයි. තෙත් කලාපයේ ජනාවාසවල උගත් තරුණ පිරිසක් සිටින අතර තේ, රබර් කලාපවල වැඩි අධ්‍යාපනයක් නොලත් කම්කරු සහෝදර පිරිසක් ඇත. මෙම දෙපාර්ශවය සඳහා පුහුණුකිරීම් කටයුතුද දෙයාකාරයකින් විය යුතුය. උගත් පිරිස තුළට අවබෝධය ලබා දීම දුෂ්කර කාර්යයක් නොවන්නාක් මෙන්ම වතු කම්කරු සහෝදර පිරිස අතර වුවද ජනාවාස සංකල්පය; එකමුතුකම, ආයතන ගොඩ නැන්වීම ආදී කරුණු ගැන අවබෝධයක් ඇති බව අප විසින් අමතක කළයුතු නොවේ. සිය අත්දැකීම් තුළින් නැතහොත් පීඩනය තුළින් ලබා ගත් අවබෝධයක් ඔවුන් සතුව ඇති බව අපගේ විශේෂ අවධානයට යොමු විය යුතුය.

ජනාවාස සංකල්පය දියුණු කිරීම සඳහා රුපියල් එක් කෝටි විසි ලක්ෂයක් ආධාර වශයෙන් ලැබී තිබීම පිරිහී යන ධෛර්යය හා පිරිහී යන විශ්වාසය නැවත නංවාලීමට ආධාරකාරී වන බව අවසාන වශයෙන් මෙහිදී සඳහන් කළ යුතුය. නුදුරු අනාගතයේදී සම්මත වීමට නියමිත ජනාවාස පනත තුළින්ද අප මුහුණ දී ඇති බාධක සමූහයක් ඉවත් කර ගැනීමට අපට හැකි වන බව නොඅනුමානය.

## සාකච්ඡාවෙහිදී හෙළිදරව් වූ වැදගත් කරුණු

ජනාවාසවල සංවිධානාත්මක, කළමනාකරණ හා පුහුණුව පිළිබඳ ගැටළු ගැන විවෘත සාකච්ඡාවකට උදැසන වරුවේ සැසි වාරය වෙන් විය. මෙම ගැටළු සම්බන්ධයෙන් අවංකව අදහස් දක්වන ලෙස සහභාගී වන්නන්ගෙන් ඉල්ලා සිටින ලදී.

ජනාවාස අතර කලාපීය වශයෙන් පවතින (තේ, රබර්, පොල් ආදී සම්බන්ධයෙනි) වෙනස්කමත්, දේශපාලනමය පසුබිමත් ජනාවාස අතර පවතින ආර්ථික විවිධතාවයනුත් හේතුකොටගෙන සාකච්ඡාවෙහිදී දක්වා ඇති මතයන්හි ඒකීයත්වයක් නොපවතින අතර ඇතැම්විට ඒවා පරස්පර විරෝධී පවා වන්නේය.

සාකච්ඡා වාරයේදී ඉස්මතු වූ වැදගත් කරුණු පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

1. ජනාවාසවල සාමාජිකයින්, කණ්ඩායම් නායකයින් සහ ක්ෂේත්‍ර සහකරුවන් යනාදීන් උදෙසා පුහුණුව පිළිබඳව සළකා බැලීමේදී පුහුණු කරවන්නන් හා පුහුණු වන්නන් අතර පරතරයක් පවතී. පුහුණු වන්නන් හට නිවැරදි පුහුණුවක් ලබා දීමට හැකි වන පරිදි පළමුකොටම පුහුණු කරවන්නන් වෙත පුහුණුවක් ලබා දිය යුතුය. පුහුණු කරවන්නන් හට මෙන් පුහුණු වන්නන් හටද දැනුම, දක්ෂතාවය හා ආකල්ප පිළිබඳව දෙනු ලැබෙන පුහුණුව ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ හා ජනාවාස පනතේ සංකල්ප රාමුව ඇතුළත විය යුතුය. පුහුණු සැසි වාරයකදී මෙම කණ්ඩායම් දෙකම පොදු අරමුණක් පෙරදැරි කරගෙන එක් විය යුතු වන්නේය. නිවැරදි පුහුණුව පටන් ගන්නේ එවිට පමණකි. හැකිතාක්දුරට කාර්යයෙහි යොදවා පුහුණු කිරීම අනුගමනය කිරීමට උත්සාහ කළයුතු වේ.

2. ජනාවාසිකයින් හට වැඩදායක පුහුණුවක් ලබා දීමට නම් පළමුකොටම ඔවුන්ගේ ජීවිකාව කරගෙන යාමට හැකි වේතනයක් ඔවුනට ලැබිය යුතු වේ. ජනාවාසයෙහි සංවිධානාත්මක දුර්වලතාවයන්ද වැඩදායක පුහුණුවක් කෙරෙහි අහිතකර අයුරින් බලපායි. බඩ ඉරිඟු, මයියොක්කා, කහ, ගුරු සහ අනිකුත් ධාන්‍ය වර්ග වැනි දේ සඳහා නිරන්තර වෙළෙඳපොළක් පවතින පරිදි රජය විසින් දීර්ඝකාලීන කෘෂිකාර්මික ප්‍රතිපත්ති සකස් කර ඒවා පවත්වාගෙන යා යුතුය.

3. පුහුණු කරවන්නන් හට පුහුණුවෙහි ඇති සඵලදායක බව නිගමනය කිරීම සඳහා පුහුණුකිරීමේ වැඩසටහන් තක්සේරු කළයුතු වේ. අපේක්ෂිත පුහුණුවක ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම සඳහා ශිල්පීය හා ද්‍රව්‍යමය යෙදවුම් සපයා දීමද වැදගත් වන්නේය.

4. පළමුකොටම කණ්ඩායම් නායකයින් හා ක්ෂේත්‍ර සහකරුවන් වැනි ජනාවාස මට්ටමේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම අවශ්‍ය වේ. සාමාජිකයින් අතුරින් පැන නැගෙන නායකයින්

හඳුනාගෙන අසල්වැසි ජනාවාසවල අනිකුත් සාමාජිකයින් පුහුණු කිරීමට ඔවුනට හැකි වන පරිදි එම නායකයින් හට වැඩදායක පුහුණුවක් ලබා දිය යුතුය.

5. පුහුණු වන්නන්ගේ අවශ්‍යතාවයන් තක්සේරු කිරීමෙන් අනතුරුව පුහුණුවීමේ වැඩසටහනකට අවශ්‍ය වන විෂය මාලාව, ක්‍රමවේදය සහ ආධාර උපකරණ තීරණය කර ගැනීම අවශ්‍ය වේ. මෙහිදී විවිධ කෘෂි දේශගුණික කලාපවල පිහිටා ඇති ජනාවාස පිළිබඳව වෙන් වෙන් වශයෙන් සැලකීමට හැකි විය යුතුය (තේ වවා ඇති පෙදෙස්වල ඇති ජනාවාස, පොල් වවා ඇති පෙදෙස්වල ජනාවාස හා රබර් කලාපයෙහි ජනාවාස ආදී වශයෙනි). පුහුණු වන්නන්ගේ අධ්‍යාපනික මට්ටම, ඔවුන්ගේ ශිල්පීය දැනුමේ ප්‍රමාණය සහ ජනාවාස සංකල්පය පිළිබඳ ඔවුන් ලබා ඇති අවබෝධය නිගමනය කර ගැනීම අරමුණු කරගෙන ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය විසින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම මෙතෙක් කළ පුහුණුවීමේ වැඩසටහන් පිළිබඳ තක්සේරුවක් කළ යුතුය. මෙවැනි තක්සේරුවකින් පුහුණු වැඩසටහන් සඳහා අර්ථාන්විත විෂයමාලා සම්පාදනය කර ගැනීමට ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමට හැකි වන අතර නිසි ක්‍රමවේදයක් හා ආධාර උපකරණ උපයෝගී කර ගැනීමටද පිළිවන් වනු ඇත.

දිස්ත්‍රික්ක මට්ටමින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමේ අධ්‍යක්ෂවරුන්; ජනාවාසවල ක්ෂේත්‍ර සහකරුවන් සහ කණ්ඩායම් නායකයින්; කොළඹ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමේ පුහුණු කරවන්නන් ආදී වශයෙන් පුහුණු කරවන්නන් සඳහා දෙනු ලැබෙන පුහුණුව අදාළ අවශ්‍යතාවයනට සරිලන පරිදි ඉලක්ක කණ්ඩායම් සඳහා විය යුතුය.

6. ජනාවාසිකයින් හා අසල්වැසි ගම්වාසීන් අතරත්, ජනාවාසයෙහි සාමාජිකයින් හා කම්කරුවන් අතරත් සුහද සම්බන්ධතාවයක් ඇති කිරීමේ හැකියාව කෙරෙහි පුහුණු වැඩසටහන්වලදී සැලකිල්ලක් දැක්විය යුතුය.

7. මහජන මන්ත්‍රීවරුන් හට ජනාවාස සංකල්පය පිළිබඳව පැහැදිලි දැනුමක් ලබා දිය යුතු අතර ග්‍රාමීය ආයතනවල හා දේශපාලන ආයතනවල සාමාජිකයින්ට මෙන්ම කෘෂිකර්ම, සමූපකාර සංවිධාන, අලෙවි සංවිධාන, ග්‍රාමීය සංවිධාන ආදී ආයතනවලත්, සංවිධාන වැඩ කටයුතු හා අදාළ අනිකුත් ආයතනවලත් නිලධාරීන් හට ජනාවාස සංකල්පය කෙරෙහි නිවැරදි අවබෝධයක් ලබා දිය යුතු වේ.

8. ජනාවාස සංකල්පය පිළිබඳව පුහුණුවක් ලබා දීමේදී දේශන ක්‍රමය වැනි සම්ප්‍රදායික පුහුණු ක්‍රම පිළිබඳව වැඩි අවධානයක් නොදක්වා නවතම ප්‍රචාරක මාධ්‍ය උපයෝගී කර ගැනීම වැඩදායක වන්නට පිළිවන. නිදසුනක් වශයෙන් මෙම සංකල්පය පිළිබඳ අදහස් පුළුල්ව පැතිරවීමෙහි ලා පත්‍රිකා, පොත්පත්, සඟරා, ගුවන්විදුලිය යනාදිය මෙන්ම නාට්‍ය හා සංගීත මාධ්‍යයන්ද උපයෝගී කර ගැනීමට පිළිවන් වන්නේය. මෙවැනි මාධ්‍යයක් කෙරෙහි විශේෂයෙන් තරුණ පිරිස් නැඹුරුතාවයක් දක්වන්නට පිළිවන.

9. ජනාවාස සාමාජික සාමාජිකාවන් 20,000 කට පමණ පුහුණුව ලබා දිය යුතු හෙයින් මධ්‍යගත පුහුණුවක් පිළිබඳව සළකා බැලීමට කිසිසේත් හැකියාවක් නොමැත. එහෙයින් ජනාවාස 170 ක පමණ සාමාජිකයින් සඳහා දෙනු ලැබෙන පුහුණුව අනිවාර්යයෙන්ම විමධ්‍යගත වේ. එහෙයින් මුලින්ම සළකා බැලිය යුත්තේ පුහුණු කරවන්නන් පුහුණු කිරීම පිළිබඳවයි. මෙහිදී පුහුණු කරවන්නන් වශයෙන් සළකා බැලිය යුත්තේ දිස්ත්‍රික් මට්ටමේ නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන් හා ජනාවාසයක කණ්ඩායම් නායකයින්ය. ජනාවාස සඳහා වන පුහුණුවීමේ වැඩසටහනක ප්‍රමුඛතාවයන් සකස් කිරීමේදී ජනාවාසිකයින් හට ඉහළ ප්‍රමුඛත්වය හිමි විය යුතුය.

10. පහත සඳහන් විෂයයන් සම්බන්ධයෙන් පුහුණුව ලබා දිය යුතු යයි අදහස් කෙරේ:

(අ) දේශපාලනික පුහුණුව;
(ආ) ශිල්පීය පුහුණුව;
(ඇ) කළමනාකාරිත්වය පිළිබඳ පුහුණුව;
(ඈ) සමාජ–ආර්ථික තත්වය පිළිබඳ පුහුණුව;
(ඉ) මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණුව;
(ඊ) සංස්කෘතික පුහුණුව.

## කණ්ඩායම් විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ

හචසී වරුවේ සැසි වාරයෙහිදී කණ්ඩායම් හතරකට බෙදුණ සහභාගී වන්නෝ පුහුණු කළයුතු අය, පුහුණුවට අඩංගු විය යුතු කරුණු, පුහුණුකිරීමේ ක්‍රම හා පුහුණු කිරීම කළයුත්තේ කවුරුන් විසින්ද යන කරුණු හතර සම්බන්ධයෙන් දැක්වූ අදහස්වල කෙටි විස්තරයක් පහත දැක්වේ.

1. පුහුණු කළයුතු අය

I. ජනාවාස මට්ටමින් පහත සඳහන් අය වෙත පුහුණුවක් ලබා දිය යුතුය.

(අ) සම්පූර්ණ සාමාජිකත්වය;
(ආ) ජනදයෙන් තේරෙනු නායකත්වය – ශිල්පීය හා සංකල්පීය පුහුණුව;
(ඇ) නව නායකත්වය හා මෙහෙයුම් කටයුතු ඉටු කරන්නෝ – ව්‍යාපාර සංවිධායක හා නායකයින්ද, ව්‍යාප්ති කාර්ය මණ්ඩලයද මෙයට අයත් විය යුතුය.

II. බාහිර මට්ටමින් පහත සඳහන් අය වෙත පුහුණුවක් ලබා දිය යුතුය.

(අ) ප්‍රතිපත්ති සම්පාදකයින් හා ඒවා ක්‍රියාත්මක කරන්නන් (විශේෂයෙන් ප්‍රධාන කාර්යාලය);
(ආ) කාර්යාලයීය සේවක මණ්ඩලය (කොළඹ හා දිස්ත්‍රික්කවල);
(ඇ) ජනාවාස කටයුතු හා සම්බන්ධව නොයෙකුත් අදාළ කාර්යයන්හි නියැලී සිටින අනිකුත් දෙපාර්තමේන්තුවල උපදේශකයින්;
(ඈ) ග්‍රාමීය මට්ටමේ විවිධ නායකයින්.

2. පුහුණුවට අඩංගු විය යුතු කරුණු

I. කළමනාකාරිත්වය:

සාමාජිකයින්ගේ යුතුකම් හා වගකීම් පිළිබඳ නිවැරදි හා පැහැදිලි අවබෝධයක් ලබා දීම වැදගත් වේ. පහත සඳහන් කරුණු පිළිබඳව පුහුණුවෙහිදී අවධානය යොමු විය යුතුයි.

(අ) පොදු දේපල අයිතිය;
(ආ) පරිපාලනය;
(ඇ) විවේචන හා සවයං විවේචන;
(ඈ) කමිටු ක්‍රියාකාරිත්වයෙහි වැදගත්කම;
(ඉ) වැඩ විද්‍යාව (කාර්යක්‍ෂමව වැඩ කිරීම);
(ඊ) කණ්ඩායම් ක්‍රමය;

(උ) ඉලක්ක, සැළසුම් හා ක්‍රම සම්පාදනය;

(ඌ) මහා සභා, කාරක සභා හා කණ්ඩායම් සාකච්ඡාවල ඇති වැදගත්කම;

(එ) විනය රැකීම හා ජනාවාසවල පොදු දේපල ආරක්ෂා කිරීම;

(ඒ) නායකත්වය හා වගකීම.

II. ගිණුම් කටයුතු:

(අ) මුදල් පරිපාලනය, බැංකු කටයුතු හා පොත් තැබීම පිළිබඳව සියළුම සාමාජිකයින්ට පොදු අවබෝධයක් ලබා දීම;

(ආ) ගිණුම් කමිටුවට විශේෂත්ව පුහුණුවක් ලබා දීම;

(ඇ) ඊට අමතරව පුද්ගලිකව ජනාවාසවලට ගොස් සෑම ගිණුම් පොතක්ම ලියන ආකාරය පිළිබඳව ජනාවාසිකයින්ට ප්‍රායෝගික අවබෝධයක් ලබා දීම;

(ඈ) සියළුම ජනාවාසවලට මුදල් භාවිතය හා පාලනය පිළිබඳව අනුගමනය කළයුතු පොදු ක්‍රමයක් සකස් කොට එය මනාව ක්‍රියාත්මක කිරීම.

III. සංස්කෘතික කටයුතු:

(අ) ජනාවාස සාමාජිකයින් තුළ සමාජ වටිනාකම ඇගැයීමේ මට්ටම දියුණු කිරීම;

(ආ) උසස් වින්දන සාමාජිකයින් තුළ ඇති කිරීමට පුහුණුවක් ලබා දීම;

(ඇ) සාමාජිකයින්ගේ චින්තන මට්ටම වැඩි දියුණු කිරීම.

3. <u>පුහුණුකිරීමේ ක්‍රම</u>

පුහුණු කරවන්නා තමන් දෙන පුහුණුව පිළිබඳවත් පුහුණුව ලබන්නන් පිළිබඳවත් මනා අවබෝධයකින් යුතුව සිය කාර්යයට ප්‍රවිෂ්ඨ විය යුතුය. විවිධ ජනාවාස සඳහා උපදෙස් දීමට විවිධ දෙපාර්තමේන්තු වලින් නිලධාරීන් පැමිණෙන විට ඔවුන්ගේ අදහස් අතර සම්බන්ධීකරණයක් තිබීම අවශ්‍ය වේ. එසේ නැතහොත් එම අදහස් පරස්පරවිරෝධී වීමෙන් ජනාවාස සංවිධාන කටයුතු අවුල් වියවුල් වීමට ඉඩ ඇත. එසේම එම නිලධාරීන් හට නියම දේශපාලන අවබෝධයක් තිබීමද මෙහි ලා වැදගත් වේ. පහත සඳහන් පුහුණුකිරීමේ ක්‍රම උපයෝගී කරගත යුතු අතර අවස්ථාවෙන් අවස්ථාවටත් වගාවෙන් වගාවටත් ගැලපෙන පරිදි පුහුණු කරවන්නා සථානෝචිතව ක්‍රියා කළ යුතුය.

I. දේශන පැවැත්වීම

II. සමූහ සාකච්ඡා

III. ප්‍රශ්නෝත්තර වාරයක් පැවැත්වීම

IV. ක්ෂේත්‍ර ගමන් හා විෂය පරීක්ෂණ (අන්තර ජනාවාස) – කලාප අතර

V. සුහද විවාද පැවැත්වීම

VI. ආදර්ශන ක්‍රම

VII. ඇදහස් ඉදිරිපත් කිරීමේ වාර
VIII. ජනාවාස සම්බන්ධව සඟරාවක් ප්‍රකාශ කිරීම (ජනාවාස ප්‍රගතිය)
IX. කෙටි ප්‍රකාශන හා පත්‍රිකා
X. අන්තර් ජනාවාස තරඟ
XI. ගුවන් විදුලිය මගින් ජනාවාස තොරතුරු ජනාවාස පැයක් ප්‍රකාශ කිරීම, ජනාවාස ප්‍රගතිය හා ජනාවාස පනත ගැන ජනප්‍රිය සාමාජික සාකච්ඡා පැවැත්වීම
XII. විශේෂ චිත්‍රපටි හා වීඩියෝ චිත්‍රපටි පෙන්වීම
XIII. නාට්‍ය මගින් සංකල්ප ප්‍රකාශ කිරීම
XIV. සම්මන්ත්‍රණ හා පුහුණුවීමේ කඳවුරු පැවැත්වීම
XV. අන්තර් ජනාවාස වගා තරඟ පැවැත්වීම
XVII. කලුලෑල්ල හා සටහන් පෝස්ටර් මගින් පුහුණුව
XVIII. ට්‍රැක්ටර් හා වාහන ගැන මධ්‍යස්ථානගත වෘත්තීය පුහුණුවක් ලබා දීම

4. <u>පුහුණුකරවීම කළයුත්තේ කවුරුන් විසින්ද?</u>

I. පුහුණු කරවීම ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදා ගත හැකිය.

(අ) ජනාවාස සාමාජිකයින්;
(ආ) මෙහෙයවන්නන්.

II. පුහුණු කරවීමට යන කණ්ඩායම්ද ආයතනික හා සංකල්ප වශයෙන් එකක්ද, ශිල්පීය (කාර්මික දැනුම) වශයෙන් එකක්ද විය යුතුය.

III. ශිල්පීය අංශය ගත් කළ

(අ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ඉඩම් පරිහරණ අංශයේ නිලධාරී කොටස;
(ආ) ජනාවාස අංශයට සම්බන්ධ කෘෂි පුහුණු අංශය;
(ඇ) තේ, පොල්, රබර් පාලන දෙපාර්තමේන්තු වලින් අනුයුක්ත කර ගත් නිලධාරීන්;
(ඈ) පශු වෛද්‍ය නිලධාරීන්;
(ඉ) දැනට ජනාවාස අංශයට අනුයුක්ත කොට ඇති කාර්මික නිලධාරීන්;
(ඊ) සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ නිලධාරීන්.

මේ අංශ වලින් තෝරා ගත් කණ්ඩායමක් බැඳවාගෙන සාමූහික අයිතිය පිළිබඳව හා ඉඩම් ප්‍රතිසංස්කරණය තුළින් ඇති වූ නව සමාජ සංකල්ප පිළිබඳව ඒ අයට අවබෝධයක් ලබා දිය යුතුය.

IV. ආයතනික හා සංකල්ප වශයෙන් ගත් කල

(අ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ දැනට සිටින ගිණුම් නිලධාරීන්;
(ආ) ජාතික කළමනාකාරිත්ව ආයතනයට අදාළ නිලධාරීන්;
(ඇ) දැනට ජනාවාසවල සේවය කරන අයගෙන් ගිණුම් කටයුතු පිළිබඳව හැකියාවක් ඇති තෝරා ගත් ලිපිකරුවන් හා සාමාජිකයින්;
(ඈ) තෝරා ගත් ක්ෂේත්‍ර නිලධාරී පිරිසකට හා ජනාවාස නායකයින්ට විශේෂ පුහුණුවක් ලබා දීම.

V. සංකල්ප වශයෙන් ගත් කළ

(අ) දැනට නායකත්වය දරන ජනාවාස වලින් තෝරා ගත් සාමාජික නායකයින්;
(ආ) තෝරා ගත් ක්ෂේත්‍ර නිලධාරීන් පිරිසක්.

## අවසාන වශයෙන් ඉදිරිපත් වුනු කරුණු පිළිබඳ සටහනක්

කණ්ඩායම් හතර විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවෙහි, පුහුණු කළයුතු අය, පුහුණුවට අඩංගු විය යුතු කරුණු, පුහුණුකිරීමේ ක්‍රම හා පුහුණුකරවීම කළයුත්තේ කවුරුන් විසින්ද යනාදිය පිළිබඳව සවිස්තරව සඳහන් වේ. ජනාවාසවල පුහුණු වන්නන් හා පුහුණු කරවන්නන් සඳහා අපේක්ෂිත ඉලක්ක කණ්ඩායම් උදෙසා අනාගත පුහුණු වැඩසටහන් පිළියෙල කිරීමේදී මෙම කණ්ඩායම් ඉදිරිපත් කර ඇති වාර්තාවල අඩංගු කරුණු ප්‍රයෝජනවත් විය හැක.

කෙසේ වෙතත් පුහුණු වැඩසටහන් සැකසීමේදී ඒවායේ පරමාර්ථයන් පිළිබඳව පැහැදිලි අවබෝධයකින් යුතුව එම වැඩසටහන් සකස් කළ යුතුය. ජනාවාසවල සාමාජික සාමාජිකාවන් උදෙසා මෙන්ම ඔවුන් පුහුණු කරවන අය උදෙසාද පුහුණු පාඨමාලා සැළසුම් කිරීමේදී සෑහෙන අවධානයක් යොමු කළයුතු බව මෙහිදී සැලකිල්ලට ගත යුතුය. පුහුණු පාඨමාලාවක ඇති අවශ්‍යතාවය, එහි පරමාර්ථයන් හඳුනා ගැනීම, විෂයමාලාවට අඩංගු විය යුතු කරුණු පිළියෙල කිරීම, පුහුණුව ලබන්නන්ගේ කාර්ය භාරය නිවැරදිව අවබෝධ කර ගැනීම, නිවැරදි ක්‍රම වේදය හා ශිල්ප ක්‍රමත්, ආධාර උපකරණත් තෝරා ගැනීම සහ අවසාන වශයෙන් පුහුණු පාඨමාලාවන් තක්සේරු කිරීමද වැනි වැදගත් කරුණු පිළිබඳව ගැඹුරින් සළකා බැලීම මෙම ක්‍රියාවලියෙහිදී අදාළ වන්නේය.

පුහුණු පාඨමාලා වැඩදායක අයුරින් සැළසුම් කිරීමේදී පහත සඳහන් කරුණු දෙක පිළිබඳව ඉතාමත් ඕනෑකමින් සළකා බැලීම අවශ්‍ය වන්නේය:

(අ) 176 ක් පමණ වන ජනාවාස සංඛ්‍යාව විවිධ කෘෂි දේශගුණික කලාපවල (තේ, රබර්, පොල් ආදී වශයෙනි) විවිධ ආර්ථික තත්වයන් යටතේ පිහිටා තිබීම;

(ආ) වෙනස් අධ්‍යාපනික මට්ටම් වලින්ද විවිධ දේශපාලනික මතිමතාන්තරයන් ගෙන්ද යුත් තරුණ තරුණියන් 20,000 ක් පමණ වන සංඛ්‍යාවක් මෙම ජනා වාස 176 හි සාමාජිකයින් වශයෙන් කටයුතු කිරීම.

ජනාවාස පිළිබඳව අගය කිරීමේ අධ්‍යයනයකින් පසුව අර්ථාන්විත පුහුණු පාඨමාලාවක් ජනාවාස සාමාජික සාමාජිකාවන් මෙන්ම ඔවුන් පුහුණු වන්නන් උදෙසාද අනාගතයේදී ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි පිළියෙල කළ යුතුය.

## <u>නිර්දේශ</u>

1. ජනාවාසවල පුහුණුවන්නන්ට සහ පුහුණු කරවන්නන්ට පුහුණු පාඨමාලා සකස් කිරීමේදී ඒවාට අදාළ වන විෂයමාලාව, ක්‍රමවේදය සහ ආධාර උපකරණ පිළිබඳ කරුණු නිගමනය කර ගැනීම සඳහා ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යන සංවිධානයන්හි ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් හා පොල් පර්යේෂණ මණ්ඩලය, රබර් පර්යේෂණ මණ්ඩලය සහ තේ පර්යේෂණ මණ්ඩලයේද ශිල්පීය නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටුවිය යුතුය.

   කමිටුව නම් කළ දින සිට මාසයක් ඇතුළත එයට අදාළ වැඩ කටයුතු කමිටුව විසින් නිම කළයුතු අතර, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේදී හෝ ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේදී කමිටුවට රැස් වීමට පිළිවන.

2. පුහුණු පාඨමාලාවල විෂයයන් තීරණය කිරීමේදී පුහුණුව ලබන අයගේ (ජනාවාසිකයින්, කණ්ඩායම් නායකයින්, ක්ෂේත්‍ර සහකරුවන් සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ පුහුණු කරවන්නන්) අධ්‍යාපනික මට්ටම් සහ ජනාවාස පිහිටා ඇති විවිධ කෘෂි දේශගුණික කලාප පිළිබඳවද සැළකිලිමත් විය යුතුය.

3. පළමුකොටම පුහුණුව ලබා දිය යුත්තේ කෘෂි දේශගුණික පදනමක් මත තෝරා ගත් පුහුණු කරවන්නන් හටය.

4. ශිල්පීය, ශිල්පීය නොවන, කළමනාකාරීත්ව, දේශපාලනික සහ සංස්කෘතික අංශ විෂය මාලාවට ඇතුළත් විය යුතුය. බෝග වැවීම, සත්ව පාලනය, පස් සංරක්ෂණය, ජලය පාලනය, මූල්‍ය කළමනාකරණය සහ ගිණුම් ආදී වශයෙන් වන ශිල්පීය පුහුණුව හැකිතාක්දුරට කාර්යයෙහි යොදවා කරවන පුහුණුවක් විය යුතු අතර එය ගැටළු සොයා බලා ඒවා විසඳීමට යෝජනා ඉදිරිපත් කරන ආකාරයෙන් විය යුතුය.

5. විවිධ කෘෂි දේශගුණික කලාප වලින් තෝරා ගනු ලැබෙන ජනාවාස, පුහුණු කරවන්නන් පුහුණු කිරීම සඳහා පදනම් කරගත යුතු වේ.

6. ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හා අනිකුත් අදාළ ආයතන විසින් යෝග්‍ය පුහුණු ආධාර උපකරණ සැපයිය යුතුයි.

   පත්‍රිකා, සඟරා, කුඩා පොත් හා අනිකුත් පුහුණු වැඩ කටයුතු සඳහා අවශ්‍ය ප්‍රකාශන ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සමඟ කටයුතු පිළියෙල කරගෙන ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයට සකස් කළ හැකිය.

7. සාමාජික සාමාජිකාවන් 20,000 කින් පමණ සමන්විත ජනාවාස 176 විවිධ කෘෂි දේශගුණික කලාපවල පිහිටා තිබීම සැළකිල්ලට ගත් කළ පුහුණුව අවශ්‍යයෙන්ම විමධ්‍යගත කළයුතු අතර තෝරා ගත් පදනමක් මත පුහුණු වන්නන්ගේ ප්‍රමුඛතා ලැයිස්තුවක් පිළියෙල කර ගත යුතුය.

## ජනාවාස පිළිබඳ පුහුණු වැඩහලට සහභාගී වූවෝ

| | | |
|---|---|---|
| කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් | : | මහින්ද සිල්වා මහතා |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සභාපති | : | කේ.එච්.ජේ.විජේදාස මහතා |
| ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ | : | සී.නාරායනසාමි මහතා |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ ප්‍රධාන අධ්‍යක්ෂ හා කෘෂිකර්ම සංවර්ධන අධ්‍යක්ෂ | : | චන්ද්‍රානන්ද ද සිල්වා මහතා |
| මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් | : | ඩබ්ලිව්. ද එස්.රත්නවීර මහතා |
| සමූපකාර කළමනාකරණ සේවා මධ්‍යස්ථානයේ සභාපති | : | ඕල්කට් ගුණසේකර මහතා |
| පුත්තලම අතිරේක දිසාපති | : | සිරිපාල ජයවීර මහතා |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ | : | එස්.ආර්.වීරකෝන් මහතා |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ (පුහුණු) | : | කරුණාසේන ජයලත් මහතා |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ | : | වී.නන්දසාමි මහතා |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ සහකාර අධ්‍යක්ෂ | : | කේ.බාලපටබැඳි මහතා |
| කොළඹ දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලයේ අධ්‍යක්ෂ | : | අතුල චන්ද්‍රසිරි මහතා |
| මාතර දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලයේ අධ්‍යක්ෂ | : | එච්.ඩබ්ලිව්.ඊ.විජේවංශ මහතා |
| බදුල්ල දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලයේ අධ්‍යක්ෂ | : | ටී.ඩී.දිසානායක මහතා |
| කුරුණෑගල දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලයේ අධ්‍යක්ෂ | : | ටී.ඒ.මෙත්තානන්ද මහතා |
| කළුතර දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලයේ අධ්‍යක්ෂ | : | විජේසිරි සොයිසා මහතා |
| ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලයේ අධ්‍යක්ෂ | : | සී.අබේගුණවර්ධන මහතා |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මිනින්දෝරු | : | එම්.ඩී.පියසිරි මහතා |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ මිනින්දෝරු | : | එෆ්.ජී.ඒ.ඩබ්ලිව්.පෙරේරා මහතා |
| ජනාවාස සැළසුම් නිලධාරී | : | කේ.ඩී.කරුණාරත්න මහතා |
| ජනාවාස සැළසුම් නිලධාරී | : | එස්.ඩබ්ලිව්.ගුණරත්න මහතා |
| ජනාවාස සැළසුම් නිලධාරී | : | කේ.එච්.අමරදාස මහතා |
| ජනාවාස සැළසුම් නිලධාරී | : | ඩබ්ලිව්.එම්.ඩී.දයාරත්න මහතා |
| ජනාවාස සැළසුම් නිලධාරී | : | ඊ.ආර්.විමලසේන මහතා |

| | | |
|---|---|---|
| ජනාවාස සම්බන්ධීකරණ නිලධාරී | : | එස්. ජයලත් මහතා |
| සමූපකාර ගම්මාන පිහිටුවීමේ නිලධාරී | : | එල්. එම්. පුංචිබණ්ඩා මහතා |
| සමූපකාර ගම්මාන පිහිටුවීමේ නිලධාරී | : | ඩබ්ලිව්. බී. විජේසුන්දර මහතා |
| ජනාවාස කෘෂිකර්ම උපදේශක | : | ක. සපුමොහොට්ටි මහතා |
| කුඹල්ගමුව පලදාව වර්ධන කමිටුවේ | : | ආර්. ඩී. එම්. පියතිස්ස මහතා |
| කළුතර, ඉංගිරිය සාමූහික ජනාවාසයේ | : | ඩී. ඒ. ඇක්මන් විජේසේකර මහතා |
| කළුතර, ඉංගිරිය සාමූහික ජනාවාසයේ | : | ටී. ඩී. ලීලාවතී මෙනෙවිය |
| කුරුණෑගල, සුනේත්‍රා සාමූහික ජනාවාසයේ | : | පී. ඒ. අනුලා තිසේරා මෙනෙවිය |
| කුරුණෑගල, සුනේත්‍රා සාමූහික ජනාවාසයේ | : | ඩී. පී. ගුණවංශ මහතා |
| කුරුණෑගල, තල්වත්තෙ ගෙදර ජනාවාසයේ | : | නන්දදාස නාරාසූරිය මහතා |
| කොළඹ, දම්මුලහේන ජනාවාසයේ | : | ගුණතුංග ඒ. මදවල මහතා |
| කොළඹ, දම්මුලහේන ජනාවාසයේ | : | එල්. විජේරත්න මහතා |
| කොළඹ, දම්මුලහේන ජනාවාසයේ | : | එන්. විමලසිරි මහතා |
| මාතර දිසාගෙවෙල ජනාවාසයේ | : | සැම් ඒකනායක මහතා |
| මාතර බිසෝදල ජනාවාසයේ | : | එඩ්මන් රුවන්පතිරණ මහතා |
| බදුල්ල, දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලයේ | : | සී. එල්. තල්දෙන මහතා |
| කුරුණෑගල, දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලයේ | : | ජේ. ඒ. ඩබ්ලිව්. ජයකොඩි මහතා |
| කුරුණෑගල, දඹකන්ද ජනාවාසයේ | : | ජේ. ඒ. සුදුවැල්ල මහතා |
| කුරුණෑගල, දඹකන්ද ජනාවාසයේ | : | ර. ඩී. විජේරත්න මහතා |
| පුත්තලම, සුනිමල් උයන ජනාවාසයේ | : | එම්. ර. චන්ද්‍රසේන මහතා |
| නිට්ටඹුව, බණ්ඩාරනායක ජනාවාසයේ | : | කේ. ඒ. රත්නාරච්චි මහතා |
| නිට්ටඹුව, බණ්ඩාරනායක ජනාවාසයේ | : | ඒ. කේ. ජයවීර මහතා |
| කුරුණෑගල, විජේපුර ජනාවාසයේ | : | ආර්. ඩී. විමලදාස මහතා |
| කුරුණෑගල, වික්‍රමසිංහපුර ජනාවාසයේ | : | බී. කුමාරතුංග මහතා |
| කොළඹ, සරස්වතී ජනාවාසයේ | : | බී. ආර්. ප්‍රේමරත්න මහතා |
| කුරුණෑගල, මයිලගම සාමූහික ජනාවාසයේ | : | ආර්. කේ. ඇඩ්ලින් මහතා |
| කුරුණෑගල, මයිලගම සාමූහික ජනාවාසයේ | : | ලතා ආලෝක බණ්ඩාර මහතා |
| ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ, පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරී | : | ආචාර්ය ඩබ්ලිව්. ගුණරත්න |
| ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ, පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරී | : | ආර්. වී. කුමාරකුලතුංගම් මහතා |